# සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO)

# රැකියා ඇබෑර්තු

ශ්‍රී ලංකාවේ බෙදා හැරීමේ උපයෝගිතා සමාගමක් වන සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම ශාඛා හතක් මගින් මීගමුව සිට ගාල්ල දක්වා වෙරළබඩ තීරය ආවරණය කෙරෙන මෙහෙයුම් ප්‍රදේශයක් ලෙස පාරිභෝගික ජනතාව 500,000 කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවය සලසන අතර, කාර්ය මණ්ඩලය 1500 කින් සමන්විත වේ. අප ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. විදුලි ඉංජිනේරු

| | |
|---|---|
| **අධ්‍යාපන සුදුසුකම්** | පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිව් අවුරුදු විදුලි ඉංජිනේරු උපාධිය හිමිකර ගෙන තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකයකුවීම හෝ එම ආයතනය විසින් පිළිගත් වෙනත් ඕනෑම සුදුසුකමක් හිමිකරගෙන සිටීම. |
| **වයස** | 2020.08.31 දිනට අවුරුදු 40ට අඩු විය යුතුය. |

## 02. කාර්මික නිලධාරී 11 ශ්‍රේණිය

| | |
|---|---|
| **අධ්‍යාපනික හා වෘත්තිමය සුදුසුකම්** | ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සහිතව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්වීම සමග පහත දැක්වෙන එක් සුදුසුකමක් සතුව තිබිය යුතුය.<br>(අ) ජාතික තාක්ෂණවේද ඩිප්ලෝමාව (විදුලිබල) - NDT<br>(ආ) උසස් ඩිප්ලෝමාව - ඉංජිනේරු (විදුලි) - HNDE<br>(ඇ) ජාතික පාඨමාලාව - ඉංජිනේරු විද්‍යාව (විදුලි ඉංජිනේරු) - NDES<br>(ඈ) තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) - Dip. Tech. (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)<br>(ඉ) සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් උසස් ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) - City & Guilds (ප්‍රායෝගික හා සිද්ධාන්ත පූර්ණ සහතිකය) |
| **වෙනත් සුදුසුකම්** | පරිගණක සාක්ෂරතාව සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම. |
| **වයස** | 2020.08.31 දිනට අවුරුදු 40ට අඩු විය යුතුය. |

## 03. පරිපාලන නිලධාරී

| | |
|---|---|
| **අධ්‍යාපනික හා වෘත්තිමය සුදුසුකම්** | අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 4/3 ක් සමත්වීම. (අදාළ වන පරිදි) සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ (CIPM / NIBM) සඳහා පිළිගත් ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමාවක්<br>හෝ<br>උපාධියක් හෝ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ වෙනත් සමාන ඉහළ සුදුසුකමක්. |
| **පළපුරුද්ද** | ලිපිකරු හා සමාන්තර ශ්‍රේණියක වසර 10ක පළපුරුද්ද. |
| **වෙනත් සුදුසුකම්** | පරිගණක තාක්ෂණවේදය සමග කම්කරු නීතිය හා කාර්මික සබඳතා පිළිබඳ දැනුම. |
| **වයස** | 2020.08.31 දිනට අවුරුදු 40ට අඩු විය යුතුය. |

## 04. නිවාඩු නිකේතන භාරකරු

| | |
|---|---|
| **අධ්‍යාපන සුදුසුකම්** | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සිංහල භාෂාව / දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ද ඇතුළුව විෂයයන් හය (06) කින් සමත්වීම. |
| **පළපුරුද්ද** | නිවාඩු නිකේතන භාරකරු තනතුරක වසර 05ක පළපුරුද්දක් තිබීම. |
| **වෙනත් සුදුසුකම්** | දේශීය හා විදේශීය ආහාරපාන පිළියෙල කිරීම, අමුත්තන් පිළිගැනීම සහ නිවාඩු නිකේතනයක භාණ්ඩ කටයුතු පිළිබඳව මනා හැකියාවක් තිබීම. |
| **වයස** | 2020.08.31 දිනට අවුරුදු 45ට අඩු විය යුතුය. |

තෝරාගත් අයදුම්කරුවන්ට ආකර්ෂණීය වැටුප් සමග ආන්තික ප්‍රතිලාභ රැසක් හිමිවේ.

කරුණාකර ඔබගේ විස්තරාත්මක ජීවදත්ත ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් අංක සහිතව, 2020.08.31 වන දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම් කරනු ලබන තනතුරු නාමය අදාළ අයදුම්පතෙහි හා කවරයෙහි වම් ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය.

LECO

**මානව සම්පත් හා පරිපාලන අංශ ප්‍රධානී**
**සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,**
**3 වන මහල, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල,**
**411, ගාලු පාර, කොළඹ 03.**